**වන සත්ත්ව සංරක්ෂණ අරමුදල - 2022**

**---------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

වන සත්ත්ව සංරක්ෂණ අරමුදලේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ගිණුම, ස්කන්ධ වෙනස් වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් “මනා ලෙස සැලසුම් කරන ලද” අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. පොදු ලෙජරය, ජර්නලය, ජර්නල් වවුචර්, ගෙවීම් වවුචර් ආදී ප්‍රධාන ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන යාම සම්බන්ධ විගණන නිරීක්ෂණ ඇතුළත් කර ඇත.

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 හි 02 ඡේදය පරිදි උපචිත පදනම මත මූල්‍ය ප්‍රකාශ පිළියෙල කළ යුතු වුවද, ජල ගැලුම් නිම්න ජාතික උද්‍යානයේ මනම්පිටිය, කන්තලේ සූරියපුර හා තුම්මෝදර යන ප්‍රදේශවල වැලි කැනීම් ව්‍යාපෘතිවලින් වැලි කියුබ් එකක් සඳහා රාජ්‍ය භාගය වශයෙන් අයකරන රු.200 ක ආදායම මුදල් පදනම මත ගිණුම්ගත කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේ ජූලි සිට දෙසැම්බර් දක්වා කාලපරිච්ඡේදය තුළ විකුණන ලද වැලි කියුබ් 63,519 ක් | තොරතුරු ලබා ගැනීමට අපහසුවීම නිසා අදාළ ගැලපීම් සිදු කිරීමට නොහැකි වූ අතර 2023 වර්ෂයේ ගිණුම් සැකසීමේදී සමුච්චිත අරමුදලට ගැලපීම් සිදු කර නිවැරදි කිරීමට කටයුතු කරමි. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 01 *හි උපදෙස් පරිදි* උපචිත පදනම මත ගිණුම් තැබිය යුතුය. |

වෙනුවෙන් ලැබිය යුතු රු.12,703,800 ක් ගිණුම් ගත කර නොතිබුණු අතර පෙර වර්ෂය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී ලද රු.6,797,640 ක් සමාලෝචිත වර්ෂයේ ආදායම වශයෙන් ගිණුම් ගත කර තිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ආදායම රු.5,906,124 කින් හා ලැබිය යුතු ආදායම රු.12,703,764 කින් අඩුවෙන් පෙන්නුම් කරන බවට නිරීක්ෂණය විය.

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පෙර වර්ෂයන්හිදී මුද්‍රණය කරන ලද පොත්පත් හා වාර සඟරා තොගයක් අරමුදල සතුව පැවතිය ද, එම තොගය ආගණනය කර මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයට ඇතුළත් කර නොතිබුණි. එම තොගයෙන් සමාලෝචිත වර්ෂය තුළදී අලෙවි කරන ලද පොත්පත් හා වාර සඟරාවන්හි පිරිවැය ගැලපීමකින් තොරව අලෙවි ආදායම රු.461,737 ක් පමණක් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයට ඇතුළත් කර තිබීමෙන් අරමුදලේ අතිරික්තය අධි ගණනය වී තිබුණි. | දෙපාර්තමේන්තුව මඟින් මෙම පොත්, අත්පත්‍රිකා හා පෝස්ටර් මීට පෙර වර්ෂවල මුද්‍රණය කරන ලද ඒවා වේ. ඉතිරි තොගය ආගනනය කොට 2023 වර්ෂයේ ගැලපීම් කොට නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | තොග නිවැරදිව ගණනය කර මූල්‍ය ප්‍රකාශන වලට ඇතුළත් කළ යුතුය. |
| (ආ) | වැඩ අවසන් කර දැනට භාවිතයේ පවතින වටිනාකම රු.9,714,883 ක් වූ යාල පරණ තොටුපළ සංචාරක බංගලාව සහ පරිහරණය කරමින් පවත්නා 2019 වර්ෂයේදී රු.9,499,790 කට මිලදී ගත් බෝට්ටු 04 ක් හා බෝට්ටු එන්ජින් 02 ක් සහ සමාලෝචිත වර්ෂයේදී රු.19,604,250 කට මිලදී ගත් capture gun 06 ක් ප්‍රාග්ධනිත කිරීමට කටයුතු නොකර කෙරීගෙන යන වැඩ ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. එම වත්කම්වලට අදාළ ක්ෂය ගණනයන් ද සිදු වී නොතිබීමෙන් | 2023 වසරේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. | පරිහරණය කරනු ලබන වත්කම් ප්‍රාග්ධනිත කර ක්ෂය ගැළපීම් කිරීමට කටයුතු කළ යුතුය. |

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ක්ෂය වියදම හා සමුච්චිත ක්ෂය ද අඩුවෙන් දැක්වුණි.

## 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1964 අංක 44 දරන පනතින් සංශෝධිත (469 වැනි අධිකාරය වන) වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනතෙහි 71 (2) (උ) වගන්තිය යටතේ 1968 නොවැම්බර් 29 දිනැති ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය මඟින් රාජ්‍ය අමාත්‍යවරයා විසින් පනවනු ලැබූ 1968 වන සත්ව සංරක්ෂණ අරමුදල් නියෝගයන්හි 11 (ආ) නියෝගය | අරමුදලට ලැබුණු සියලු මුදල් මෙන්ම අරමුදලෙන් ගෙවනු ලැබූ සියලු මුදල් ද දැක්වෙන ත්‍රෛයිමාසික ප්‍රකාශයක් භාණ්ඩාගාරයේ ලේකම් වෙත යවා නොතිබුණි. | 2023 වර්ෂයේ සිට ලැබුණු මුදල් සහ ගෙවනු ලබන මුදල් දැක්වෙන ත්‍රෛයිමාසික ප්‍රකාශයක් භාණ්ඩාගාර ලේකම් වෙත යැවීමට කටයුතු කරමි. | පනතේ විධි විධාන ප්‍රකාරව අරමුදලේ ලැබීම් හා ගෙවීම් සම්බන්ධ ත්‍රෛයිමාසික ප්‍රකාශය සකස් කර භාණ්ඩාගාර ලේකම් වෙත යැවිය යුතුය. |
| (ආ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | |
| | (i) මුදල් රෙගුලාසි 103(1)(ඉ) ඡේදය | 2014 – 2017 කාලය තුළ නැති වූ ගිනි අවි 05 ක් හානි පාඩු ලේඛනයේ සටහන් කර නොතිබුණි. | මේ වන විට විමර්ශන මණ්ඩලයක් පත්කර විමර්ශන කටයුතු සිදුකරමින් පවතී. | විමර්ශන මඟින් නිසි පියවර ගැනීමටත්, හානි පාඩු ලේඛනයේ සටහන් කිරීමටත් කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | (ii) මුදල් රෙගුලාසි 104(1)(අ) ඡේදය | 2009 නොවැම්බර් මස 24 දින AB 40687 දරන පිස්තෝලය නැති වීම සම්බන්ධයෙන් පරීක්ෂණයක් සිදු කර නොතිබීමෙන් අලාභයේ ප්‍රමාණය, ඊට හා හේතු හා වගකිව යුත්තන් නිශ්චය කරගෙන නොතිබුණි. | විමර්ශන වාර්තාව නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා යොමු කර ඇත. | මුදල් රෙගුලාසි පරිදි නොපමාව පරීක්ෂණ කටයුතු සිදු කර අදාළ නිර්දේශ ක්‍රියාත්මක කළ යුතුය. |
| | (iii) මුදල් රෙගුලාසි 877 (2)(අ) හා 2020 අගෝස්තු 08 දිනැති අංක 1/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15.1(3)(2)(අ) ඡේදය | සෑම අරමුදලක් සඳහාම වෙනම බැංකු ගිණුමක් පවත්වා ගෙන යා යුතු වුවත් අරමුදලේ කටයුතු දෙපාර්තමේන්තු බැංකු ගිණුම ආශ්‍රයෙන් පවත්වා ගෙන ගොස් තිබුණි. | වන සත්ත්ව සංරක්ෂණ අරමුදල මහා භාණ්ඩාගාරය සමඟ පවත්වා ගෙන යනු ලබන ගිණුම් ප්‍රකාශ අනුව පොදු තැන්පතු ගිණුමක් වේ. එබැවින් ඒ සඳහා වෙනමම බැංකු ගිණුමක් පවත්වා නොගනී. | මුදල් රෙගුලාසි හා රාජ්‍ය මුදල් චක්‍රලේඛය පරිදි අරමුදල් සඳහා වෙනම බැංකු ගිණුමක් ආරම්භ කිරීමට කටයුතු කළ යුතුය. |
| **(ඇ)** | 2019 ජුනි 13 දිනැති හා අංක 01/2018(i) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදය | සියලුම රාජ්‍ය ආයතන විසින් සපයනු ලබන්නා වූ විවිධ සේවාවන් සඳහා දැනට අය කරනු ලබන ගාස්තු සියයට 15 කින් ඉහළ දැමිය යුතු වුවද, 2006 පෙබරවාරි 20 දිනැති අංක 1433/4 දරන අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ජාතික රක්ෂිතයක හෝ | ජාතික රක්ෂිතයක හෝ අභය භූමියක පිහිටි ජලාශයක මසුන් ඇල්ලීමට භාවිතා කරනු ලබන ධීවර යාත්‍රා සඳහා අයකරනු ලබන රු.250 ක බලපත්‍ර ගාස්තුව මෙන්ම අදාළ ගැසට් පත්‍රය ද මේ වන විට සංශෝධිත මට්ටමේ පවතී. | රාජ්‍ය මුදල් චක්‍රලේඛය පරිදි ගාස්තු සංශෝධනය කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අභය භූමියක පිහිටි ජලාශයක මසුන් ඇල්ලීමට භාවිතා කරනු ලබන ධීවර යාත්‍රා සඳහා අය කරනු ලබන රු.250 ක බලපත්‍ර ගාස්තුව සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් සංශෝධනය කර නොතිබුණි. | | |
| (ඇ) 2020අගෝස්තු 28 දිනැති අංක 2020/01දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ I කොටසෙහි මාර්ගෝපදේශ 04 හි 15.1 ඡේදය යටතේ වන මුදල් රෙගුලාසි 877(2)(ඇ) | | | |
| i. 03 වන රෙගුලාසිය | එක් එක් කාර්තුව අවසානයේ අරමුදලේ ප්‍රගතිය සමාලෝචනය කළ හැකි පරිදි අරමුදලේ ප්‍රධාන කාර්යයන් පිළිබඳ කාර්තුමය වාර්තා කාර්තුව අවසන් වී දින 15 කට පෙර රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තු, ජාතික අයවැය දෙපාර්තමේන්තුව හා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, එසේ කටයුතු කර නොතිබුණි. | පරීක්ෂා කර බලා 2023 වසරේ සිට කාර්තුමය වාර්තාවක් ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | අදාළ කාර්තුමය වාර්තා නියමිත පරිදි සකස් කර අදාළ අංශයන් වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| ii. | 07 වන රෙගුලාසිය | අදාළ ගිණුම් වර්ෂය සඳහා අනුමත වී ඇති අයවැය සීමාවන් සැසඳීමක් කර මූල්‍ය ප්‍රකාශන සමඟ අයවැය සැසඳුම් ලේඛනය ඉදිරිපත් කර නොතිබුණි. | පරීක්ෂා කර බලා 2023 වසරේ සිට මූල්‍ය ප්‍රකාශන සමඟ අයවැය සැසඳුම් ප්‍රකාශයක් ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසි පරිදි අයවැය සැසඳුම් ලේඛනයක් සකස් කළ යුතුය. |
| iii. | 5.1 රෙගුලාසිය | මූල්‍ය ප්‍රකාශන සමඟ කාර්යසාධන වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. | පරීක්ෂා කර බලා 2023 වසරේ සිට නිවැරදි කිරීමට කටයුතු කරමි. | මූල්‍ය ප්‍රකාශන සමඟ කාර්යසාධන වාර්තාව ඉදිරිපත් කළ යුතුය. |
| iv. | 6 (ආ) රෙගුලාසිය | සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතු වුවද, සිංහල භාෂාවෙන් පමණක් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණි. | 2023 වසරේ සිට මූල්‍ය ප්‍රකාශන භාෂා ත්‍රිත්වයෙන් ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | මූල්‍ය ප්‍රකාශන භාෂා ත්‍රිත්වයෙන් ඉදිරිපත් කළ යුතුය. |
| (ඉ) | 2009 නොවැම්බර් 08 දිනැති හා අංක 05/2009 දරන දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 07(7) ඡේදය | කලාප කාර්යාල විසින් ඊළඟ මාසයේ 20 වන දිනට පෙර ප්‍රධාන කාර්යාලයට එවිය යුතු බල ප්‍රදේශයේ ගිනි අවි හා පතරොම් පිළිබඳ මාසික වාර්තා නියමිත පරිදි එවා නොතිබුණි. | තම බල ප්‍රදේශයේ ගිනි අවි සහ පතරොම් පිළිබඳ මාසික වාර්තාව ඊළඟ මාසයේ 20 වන දිනට පෙර ප්‍රධාන කාර්යාලයට එවිය යුතු බවට දැනුවත් කරමින් කලාප කාර්යාලවලට ලිපි යොමු කර ඇත. | ගිනිඅවි හා පතරොම් සම්බන්ධ මාසික වාර්තා නියමිත පරිදි ලබා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඊ) | 2014 මාර්තු 19 දිනැති අංක 1/2014 දරන දෙපාර්තමේන්තු ගිණුම් චක්‍රලේඛයේ 1.4.3 ඡේදය | ප්‍රධාන කාර්යාලයේ ගබඩාවෙන් ගිනි අවි නිකුත් කිරීම, ආපසු ගබඩාවට භාරදීම, අපහරණය සටහන් කිරීම සඳහා වන ලේඛනය යාවත්කාලීනව පවත්වා ගෙන යාමට කටයුතු කර නොතිබුණි. | ප්‍රධාන කාර්යාල ගබඩාවේ ගිනි අවි සටහන් කිරීම සඳහා පවත්වා ගෙන යනු ලබන ලේඛනය යාවත්කාලීනව පවත්වා ගැනීමට ගබඩා භාර නිලධාරීන් වෙත උපදෙස් ලබා දුනිමි. | ගිනි අවි සම්බන්ධ ලේඛනය යාවත්කාලීනව පවත්වා ගනිමින් ගිනි අවිවල අවශ්‍ය භාවිතය හා පැවැත්ම සනාථ කරගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.248,108,226 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.710,716,619 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.958,824,845 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට පසුගිය වර්ෂයට සාපේක්ෂව සංචාරකයින්ගේ පැමිණීම වැඩි වීම හා උද්‍යාන පිවිසුම් ගාස්තු ඇතුළුව අනෙකුත් ගාස්තු සංශෝධනය ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ පවතින ජාතික රක්ෂිත ප්‍රදේශ සඳහා ඇතුල්වීමේ ගාස්තු 2022 අගොස්තු 08 දිනැති අංක 2292/11 දරන ගැසට් පත්‍රය මගින් එදින පටන් සංශෝධනය කර තිබුණ ද, එම ගාස්තු සංශෝධනය 2022 සැප්තැම්බර් මස 02 වන දින සිට අදාළ කර ගෙන ඒ දක්වා පැරණි ගාස්තුව අය කර තිබීම හේතුවෙන් පරීක්ෂාවට ලක්කළ යාල, කුමන, ලාහුගල, මාදුරු ඔය, ගල්ඔය, | නව ගාස්තු ඇතුළත් කර බලපත්‍ර නිකුත් කළ යුතු වුවද, එම සංශෝධිත ගැසට් පත්‍රය ලැබුණේ 2022 සැප්තැම්බර් මස 01 වන දින වන හෙයින් නව ගාස්තු යටතේ බලපත්‍ර නිකුත් කිරීම 2022 සැප්තැම්බර් 02 වන දින සිට සිදු කරනු ලැබුණි. | ගැසට් පත්‍රයේ සඳහන් දිනයේ සිට සංශෝධිත ගාස්තු අය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | විල්පත්තුව, ගැල්වෙස්ලෑන්ඩ් යන ජාතික උද්‍යාන 07 ක පමනක් එම කාලයට අදාළව රු.16,844,205 ක ආදායමක් අහිමි වී තිබුණි. | | |
| (ආ) | මුදල් රෙගුලාසි 137(5) ප්‍රකාරව සැපයීම සම්බන්ධයෙන් වන අවස්ථාවලදී ඒවා පරීක්ෂා කර නිවැරදි ලෙස භාර ගෙන තිබෙන බවට ගෙවීම් අනුමත කරන නිලධාරියා සෑහීමකට පත් විය යුතු වුවද, ලුණුගම්වෙහෙර අලි රැඳවුම් මධ්‍යස්ථානය වටා වැට ඉදිකිරීමට අවශ්‍ය රේල් පීලි 4,333 ක් ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට 2021 වර්ෂයේදී රු.15,815,699 ක මුදලක් ගෙවා තිබුණු නමුත් සපයා තිබුණු ප්‍රමාණය රේල් පීලි කොටස් 660 ක් පමණක් විය. | සැලසුම් කර තිබූ රේල් පීලි නිකුත් කිරීම අත්හිටුවීමට සිදුවන බව දන්වා තිබුණි. රේල්පීලි 3,608 ලබා දීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලෙස 2023.02.16 දින ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ සාමාන්‍යාධිකාරීගෙන් ලිඛිතව ඉල්ලීමක් කර ඇතත් මේ දක්වා එම රේල්පීලි සැපයීම සිදුකර නැත. | ඉතිරි රේල්පීලි කොටස් ලබා ගැනීම සඳහා නිසි ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) | 2009 අංක 22 දරන වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක (සංශෝධන) පනතේ II වන උපලේඛනයට ඇතුළත් දැඩි ලෙස ආරක්ෂිත ක්ෂීරපායී සතුන් සහ උරගයින් වර්ගයට අයත් කැස්බෑවන්, තල්මසුන් සහ ඩොල්ෆින් සතුන් 439 ක් 2021 මැයි 20 දින ගිනිගෙන මුහුදු බත් වූ MV X-Press Pearl නෞකාව හේතුවෙන් මිය ගොස් තිබුණි. මිය ගිය සතුන් සොයා ගැනීමේ පරීක්ෂණ වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් රු.2,378,249 ක වියදමක් දරා තිබුණු අතර එම මුදල ප්‍රතිපූරණය කර ගැනීමට හෝ ලැබිය යුතු මුදලක් ලෙස අරමුදලේ මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීමට හෝ කටයුතු කර නොතිබුණි. | අදාළ නෞකා අනතුර වෙනුවෙන් සිදු කරන ලද සියළුම වියදම් ප්‍රතිපූර්ණය සඳහා සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය වෙත සියලු තොරතුරු සපයමින් ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත. | වැය වූ මුදල් ප්‍රතිපූර්ණය කර ගැනීමට නිසි ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3.2 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3 මාර්ගෝපදේශය ප්‍රකාරව මූලික පාරිසරික පරීක්ෂණයක්, පාරිසරික බලපෑම් තක්සේරුවක් සහ සමාජයීය බලපෑම් තක්සේරුවක් සිදු නොකර රු.241,229,637 ක කොන්ත්‍රාත් වටිනාකමකට අනුරාධපුර දිස්ත්‍රික්කයේ කලාප අංක 01 සඳහා කිලෝමීටර් 123 ක දිගින් යුත් විදුලිවැට ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබීම හේතුවෙන් විදුලි වැට ඉදිකරගෙන යාමේදී මහජන විරෝධතා, අලිමංකඩ අවහිර වීම්, ඉඩම් ගැටලු ඇති වීම යනාදී කරුණු මත 2020 ජනවාරි 28 දින වැඩ අවසන් කළ යුතුව තිබූ කොන්ත්‍රාත්තුවේ භෞතික ප්‍රගතිය සියයට 37 ක් ව තිබියදී අතරමග නවතා දමා තිබුණි.<br>මෙම කොන්ත්‍රාත්තුව සඳහා ලබා දී තිබුණු වැඩ මූලික අත්තිකාරමෙන් රු.28,327,073 ක් අය විය යුතුව තිබියදී ඒ සඳහා ලබා ගෙන තිබූ රු.48,245,927 ක බැඳුම්කරය 2021 දෙසැම්බර් 31 දින කල් ඉකුත් වී යාමට ඉඩ ලබා දී තිබුණු අතර කාර්යසාධන ඇපකරය රජයට පවරා ගැනීමට එරෙහිව අදාළ කොන්ත්‍රාත්කරු විසින් 2021 නොවැම්බර් 16 දින අධිකරණයේ නඩු පවරා තිබුණි. මෙම කොන්ත්‍රාත්තුවට අදාළව රු.117,587,007 ක් ගෙවා ඇති බවට නිරීක්ෂණය වුවද, ගෙවීම් වවුචර් 02 ක් අස්ථානගත වී තිබීමෙන් ඊට අදාළ ගෙවීම්වල නිවැරදිතාවය සනාථ කළ නොහැකි විය. | විදුලි වැට ඉදිකිරීමේ දී මූලික පාරිසරික පරීක්ෂණයක් සිදු නොකරන අතර, වන අලින්ගේ සංක්‍රමණික මාර්ග අවහිර වන අයුරින් විදුලි වැට ඉදිකිරීම සිදු නොකරයි.<br>මෙම කොන්ත්‍රාත්තුවට අදාළව ජාතික බේරුම්කරණ මධ්‍යස්ථානයේ ආරම්භ කර ඇති බේරුම් ක්‍රියාවලිය මේ වන විට සිදුවෙමින් පවතී.<br>2019 වර්ෂයට අදාළ වවුචර්පත් සොයා ගැනීමට නොහැකි වූ අතර, ඉදිරියේදී පරීක්ෂා කර බලා මෙම වවුචර් විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරමි. | අයවිය යුතු මුදල් අයකර ගැනීමටත්, ව්‍යාපෘතිය ඵලදායී ආකාරයට අවසන් කිරීමටත් කටයුතු කළ යුතු අතර සියලුම ගෙවීම් වවුචර්වලින් සනාථ විය යුතුය. |